# දෙවියන්වහන්සේගේ පොරොන්දුවල ඔබේ කොටස



ආබ්‍රහම්...... මම මුහුදු වෙරළෙහි වැලි මෙන්
නුඹේ වංශය බොහෝ සෙයින් වැඩි කරන්නෙමි. (උත්පත්ති 22:17)

Your Share in God's Promises

# දෙවියන්වහන්සේගේ පොරොන්දු වල ඔබේ කොටස

- ඩේවිඩ් එම්. පියර්ස් -

# පටුන


| | |
|---|---|
| "ඊශ්‍රායෙල්හි බලාපොරොත්තුව" පිළිබඳව බයිබල් ඉගැන්වීම් | 3 |
| පදනමක් සහිත බලාපොරොත්තුවක් | 3 |
| පූර්ණ ඒත්තු ගැන්වීම | 4 |
| ආබ්‍රහම්ට දුන් පොරොන්දු | 5 |
| උදාර ගිවිසුමක් | 6 |
| උරුමය තවමත් නැත | 7 |
| ඊශ්‍රායෙල් සඳහා දෙවියන්වහන්සේගේ දිවුරුම | 8 |
| දාවිත් රජු සමඟ ගිවිසුමක් | 10 |
| නැවත පිහිටුවන පොරොන්දු | 11 |
| මෙසියස්වහන්සේ ගැන යෙසායාගේ අනාවැකි | 12 |
| යෙරමියා සහ අලුත් පෙරොන්දුව | 13 |
| රාජ්‍යය ගැන එසකියෙල්ගේ දර්ශනය | 14 |
| යේසුස්වහන්සේගේ පැමිණීම | 15 |
| ක්‍රිස්තුස්වහන්සේගේ කාර්යය | 16 |
| අභිරහසේ එළිදරව් වීම | 17 |
| ක්‍රිස්තුස්වහන්සේ නැවත පැමිණීමේ අවශ්‍යතාවය | 18 |
| රුධිරයෙන් මුද්‍රා කළ ගිවිසුමක් | 19 |
| පොරොන්දු වල උරුමක්කාරයින් | 20 |
| දෙවියන්වහන්සේට අමතක නොවූ බවට සලකුණු | 22 |
| නැංගුරමක් මෙන් ස්ථිර | 22 |
| ප්‍රශ්න | 24 |

# දෙවියන්වහන්සේගේ පොරොන්දුවල ඔබේ කොටස

## "ඊශ්‍රායෙල්හි බලාපොරොත්තුව" පිළිබඳව බයිබල් ඉගැන්වීම්

එදිනෙදා සාකච්ඡාවලදී අපි බලාපොරොත්තු පිළිබඳ කථා කරන්නෙමු. "ඔබට ඉක්මනින් සුවවේයැයි මම බලාපොරොත්තු වෙමි" හෝ "අපි මේ වසරේ පිටරට යෑමට බලාපොරොත්තු වෙමු" හෝ "ලබන සතියේ *වැඩවර්ජනය සමථයකට පත්වීම බලාපොරොත්තු විය හැකි"* බව හෝ අපි පවසන්නෙමු. අප අදහස් කරන්නේ අනාගතයේදී, යම් දෙයක් සිදුවනවාට අප බොහෝ කැමති මෙන්ම, අවංකව එහි යහපතක් වේ යැයි බලාපොරොත්තු විමයි.

බලාපෝරොත්තු නැති ජීවිතයක් ඉතා කාලකණ්ණි එකකි. ඉතා දුෂ්කර අවස්ථාවලදී වුවද මිනිසුන් දීප්තිමත් පැත්ත දැකිමට කැමතිය. ඉංග්‍රිසි කවියෙකු ලියා ඇත්තේ, බලාපොරොත්තුව මිනිසුන්ගේ හදවත් තුළ සදාකාලිකව පැන නගින බවයි. පතල්කරුවන් වහලය කඩා වැටීමෙන් හෝ නැවියෙකු ඔරුව ගසාගෙන යාමෙන් දින ගණනක් මරණය හා සටන් කිරීම වැනි අවස්ථාවක, තමන්ගේ යහළුවන් තමන් ගලවා ගැනීමට පැමිණෙනු ඇතැයි සිතීමට තරම් බලාපොරොත්තුව ශක්තිමත්ය. එසේ බලාපොරොත්තු තබා සිටියද, ඇත්තෙන්ම කණගාටුවෙන් හෝ කිව යුත්තේ, සමහර විට ඔවුන් ප්‍රමාද වැඩි බවය. සමහර විට නායගිය කන්ද උමග තුළට ගැඹුරු ලෙස වැදී තිබීම හෝ නැව ගිලී ඇතැයි නොසිතන අය එම දීගාවට යාත්‍රා නොකිරීම නිසා විය හැකිය. මේ සිද්ධි වලදී, ඔවුන් බලාපොරොත්තුව සිටින දේ නොවීම නිසා එම බලාපොරොත්තු මායාවකි.

### පදනමක් සහිත බලාපොරොත්තුවක්

බලාපොරොත්තු නිතරම බයිබලයේ සඳහන්වන මූලික මාතෘකාවකි. පැරණි සහ නව ගිවිසුම් ලේඛකයෝ නිතරම සුභවාදී වූහ. ඔවුහු, භයානක අයුක්ති සහගත මෙලොව දුටුවේ, නිතරම අහිංසකයන් දුක්විඳින සහ නපුරු මිනිසුන් ජයග්‍රාහිවන ලොවක් ලෙසිනි. නමුත් ඔවුන් මහත් විශ්වාසයකින් බලා සිටියේ යම් දිනෙක මැවුම්කාර දෙවියන්වහන්සේ මේ සියල්ල නිසි අයුරින් යහමඟට ගන්නා බවය. එපමණක් නොව, ඔවුහු පැමිණෙන්නාවූ යහපත් ලෝකයේ කොටස්කරුවන් ලෙස තමන් සැලකූහ. නිදසුනක් ලෙස, ගීතාවලිය කතුවරයාට කන්දෙමු. "දෙවියන්වහන්ස, ඔබේ ධර්මිෂ්ඨකම ඉතා උසස්ය. මහත් දේවල් කළ දෙවියන්වහන්ස ඔබට සම වන්නේ වෙන කවුද? බොහෝ

තද දුක් අපට පැමිණෙවූ ඔබ, නැවත අප ජීවත් කොට, පොළවේ ගැඹුරු තැන්වලින් අප නැවත ගොඩගන්නා සේක...... විධාවෙන් ඔබට ගායනා කරන්නෙමි. මා විසින් ඔබට ප්‍රශංසා ගී කියන කළ මාගේ තොල්ද ප්‍රීතිවන්නේය." (ගීතාවලිය 71:19-23). මේ මිනිසාගේ අනාගතය පිළිබඳ විශ්වාසය සැකයක් නැත.

අපෝස්තුළු පාවුල් ඉතා ශාන්ත විලාසයෙන් තිමෝතිට ලියූ ජේදය: "මම දැන් යාග කරනු ලබමින් සිටිමි. මාගේ ඉකුත්වීමේ කාලයද පැමිණ තිබේ. මම යහපත් යුද්ධයක් කළෙමි. මම දිවීම කෙලවර කළෙමි. මම ඇදහිල්ල රක්ෂා කළෙමි". ඔහු තවදුරටත් සටහන් තබන විට කෙතරම් විශ්වාසගිලිද්දැයි බලන්න." මෙතැන් පටන් ධර්මිෂ්ඨකමේ ඔටුන්න මට තබා තිබේ. එය ධර්මිෂ්ඨ විනිශ්චයකාරවූ ස්වාමීන්වහන්සේ ඒ දවසේදී මට දෙනවා ඇත. මට පමණක් නොවේ. උන්වහන්සේගේ ප්‍රකාශවීමට ආශාව සිටින්නාවූ සියල්ලන්ටද දෙනවා ඇත. (2 තිමෝති 4:6-8)

මේ අන්තිම ජේදය විශේෂයෙන් වැදගත් වන්නේ ඔහු එය ලිවේ මරණයට නියමව සිරකුටියේදී නිසාය. රෝමානු අධිරාජයා ක්‍රිස්තියානීන්ට එරෙහි විය. වයස්ගත අපෝස්තුළුවරයා ඔහුගේ ජීවිතය විනිශ්චයට මුහුණ දෙන්නට සිදුවිය. පළමුවර නඩු ඇසීම අවසන්වී තිබුණි. දෙවැන්න සඳහා ඔහු බලා සිටියේය. සිදුවන්නේ කුමක්ද බවත් ඔහු දැන සිටියේය. ඔහු තරුණ තිමෝතිට ලිවේ ඔහුගේ සීතල සිරකුටියේ සිටය. ඔහු මිය යෑමට සිටියේය. ඉදිරියේ මෙම කණගාටුදායක ප්‍රතිඵලය ඇතිමුත්, ඔහු විශාල බලාපොරොත්තුවක් තබා ගත්තේය. යටවී ගිය පතල්කරුවන් හෝ මුහුදුබත් වූ නැවියා මෙන් නොව, හිතවතෙකුගේ සාක්ෂියකින් හෝ බලවත් ලිපි ලේඛණයකින් හෝ දඬුවමින් නිදහස් වීමේ බලාපොරොත්තුවක් ඔහුට නොවිය. ඇත්තෙන්ම ඔහු බලාපොරොත්තු වූයේ, මිය යාමෙන් පසු ස්වර්ගීය දෙවියන්වහන්සේ අන්තිම දිනයේදී අලුත් හා වඩා යහපත් ජීවිතයක් ඔහුට ලබාදෙන බවය.

## පූර්ණ ඒත්තු ගැන්වීම

බයිබල් ලේඛකයන්ගේ බලාපොරොත්තුව පරීක්ෂාකාරී සුභවාදයකට වඩා බලවත් එකක් විය. ඔවුනට අනාගතයේ සිදුවන දේ පිළිබඳ ස්ථිර අදහසක්වූ අතර, ඔවුහු එය සිදුවන තෙක් බලා සිටියහ. දුකක් වේදනාවක් ඔබේ ජීවිතයේ ඇතිවූවා නම් ඔබ අපෝස්තුළු පාවුල්තුමාට ඊර්ෂ්‍යා කරනු ඇත. පසුගිය කාලයේ ඔබ සුසානයෙන් ඔබ්බට විශ්වාස කිරීමට යමක්

ඇද්දැයි සැක කළා විය හැක. ඔබට තවත් පුදුමයක් වන්නට ඇත්තේ ලෝකයට කුමක් වන්නේද කියා විය හැක. ඔබේ දරුමුණුබුරන් ඔබෙන් පසු උරුමකරගන්නේ කුමක්දැයි කියාද? ධෛර්යමත් වන්න, අනාගතය සඳහා යතුර ඇත්තේ බයිබලයේය. ලෝකය සහ ඔබ යන දෙකටමය. දෙවියන්වහන්සේ විසින් පොරොන්දුවූ ප්‍රකාර ආරම්භයේ සිටම ස්ථිරවම අනුගමනය කරන වැඩපිළිවෙලක් එහි ඔබට ප්‍රදානය කරයි. එය පදනම් වී ඇත්තේ උන්වහන්සේ කර ඇති පොරොන්දු මතය. මෙහි කටුසටහන ඊශ්‍රායෙල්හි පියාවූ ආබ්‍රහම් සමඟ වුවත්, එය ප්‍රොපේතවරු මගින් නවගිවිසුම දක්වා විහිදේ. එය ඉතා පැහැදිළි අතර, ළමයෙකුට වුවද තේරුම්ගත හැක. එය ඔබව වේදනාවේ අඳුරු නිම්නය තුළින් විශ්වාසයට ගෙනයා හැකිය. දෙවියන්වහන්සේ ඔබේ විශ්වාසයට උපකාර පිණිස ශක්තිමත් සාක්ෂි ඉදිරිපත් කරන අතර, අහංකාර කමින් හෝ මෝඩකමෙන් පමණක් ඔබේ ඇස් අන්ධවිය හැකි බැවින් ඒ සියල්ල එකට ගැටගැසෙන හැටි කියවා බලන්න.

## ආබ්‍රහම්ට දුන් පොරොන්දු

අපගේ කථාව ඊශ්‍රායෙල්වරුන්ගේ පොතවූ පැරණිගිවිසුමෙන් පටන් ගනී. මෙය ඔබ අධෛර්යය කිරීමට හේතුවක් නොකරගන්න. පැරණිගිවිසුම අනවශ්‍යය හෝ යල්පැන ගිය දෙයක් නොවේ. එහි විෂයයන් නොපුරුදු විය හැකිය. නමුත් බයිබලයේ මෙම මුල් පොත් තුළ හමුවන්නන් නිධානයන්ය. නිදසුනක් වශයෙන් කිහිපදෙනෙක් පමණක් ආබ්‍රහම්ට දුන් පොරොන්දු පිළිබඳව අසා ඇති අතර පටන්ගැන්මෙහිදී දෙවියන්වහන්සේගේ ප්‍රධාන සැලසුමේ මේවා තිබූ බව අපට පෙනේ. අපි ඒවා කෙටියෙන් සලකා බලමු.

සැලකිය යුතු චරිතයක්වූ ආබ්‍රහම් ක්‍රි.පූ. 2000දී පමණ, අප දැන් ඉරාකය යනුවෙන් හඳුන්වන රටේ, "ඌර්" නගරයේ විසුවෙකි. එක්දිනක් දෙවියන්වහන්සේගේ පණිවිඩකරුවෙක් ඔහු දකින්නට පැමිණියේය. ඔහු පැවසුවේ තමන් උපන් දේශයෙන් පිටවී, "මා පෙන්වන්නාවූ රටට ඔබ යන්න" කියාය. (උත්පත්ති 12:1). මෙතෙම දෙවියන්වහන්සේ විශ්වාස කළ බැවින්, ඔහු සතු සියල්ල විකුණා තම නෑයින් සමඟ කාන්තාරය හරහා යන්නට පිටත් විය. ඔවුහු, අප ඊශ්‍රායේල නමින් දන්න රටට පැමිණියහ. ඔහු එම දේශය ස්වල්පයක් පරීක්ෂාකළ පසු ස්වාමින්වහන්සේ නැවත පෙනී සිට මෙසේ කිය. "ඔබේ පරපුරට මා මේ දේශය දෙන්නෙමි". (උත්පත්ති 12:7). මේ පරිත්‍යාගශීලි දීමනාව විශේෂයෙන් ආබ්‍රහම්ට හා ඔහුගේ බිරිඳ සාරාට ප්‍රීතිදායක එකක් වූයේ, ඔවුන්ගේ දීර්ඝ හා ප්‍රීතිමත්වූ විවාහ ජීවිතයේ දරුවන් නොසිටි නිසාය.

එය දෙවියන්වහන්සේ ඔවුනට කෙසේ හෝ ජිවත් විමට පවුලක් දෙන බවත් හැඟවුණි. වසර ගණනක් පසුවිය. ආබ්‍රහම් ඔහුගේ කූඩාරමේ කඳවුරු ගසා සිටියේ යමක් සිදුවීමට පෙර ඉවසිලිවන්තවය. නමුත් දරුවෙකු ලැබෙන බවට ඉඟියක් හෝ නොවිය. මේ අතර දේශයේ පදිංචිකරුවෝ ඔවුන්ගේ එදිනෙදා කටයුතු කරගෙන ගියහ. එක් සැන්දෑවක ස්වාමීන්වහන්සේගේ පණිවිඩකරුවෙක් නැවතත් පෙනී සිටියේය. ආබ්‍රහම්, වැදගත් ප්‍රශ්න දෙකක් ඇසීමට අවස්ථාව ග්‍රහණය කරගත්තේය. "බලන්න," ඔහු ආචාරශිලීව පැමිණිලි කරමින්, "ඔබ මට පරපුරක් දුන්නේ නැතැයි" කීය. පිළිතුරක් වෙනුවට ඔහු කූඩාරමෙන් පිටතට ගෙනවුත් තරු බැබලෙමින් තිබූ අහස පෙන්වන ලදී. ඔබට ගණන් කළ හැකි නම් තාරකා ගනින්නැයි ඔහුට කියන ලදී. තවද "ඔබේ පරපුරත් එසේම වන්නේ" යැයි කියන ලදී. ආබ්‍රහම්ට ගැටළුවක්වූ අනෙක් කාරණය වූයේ දේශයයි. "මම නුඹව උර් වලින් ගෙන ආ ස්වාමීන්වහන්සේය....... මෙම දේශය නුඹට දෙන්නෙමි"යි දේවදූතයා සිහිකරවිය. "ස්වාමීවූ දෙවියන්වහන්ස, එය මට උරුම වන බව කුමකින් දැනගන්නෙම්ද,"යි ඔහු ඇසිය.

## උදාර ගිවිසුමක්

පිළිතුර සඳහා උදාර ගිවිසුමක් කිරීමට ස්වාමීන්වහන්සේ ආරම්භ කළේ එම කාලයේ චාරිත්‍රයට අනුවය. ඔහු ප්‍රවේශමෙන් සොයා එකතු කරගත් සතුන් හා කුරුල්ලන්ගෙන් ප්‍රමාණයක් රැස්කර ගැනීමට උපදෙස් දෙන ලදී. ඒවා යාගයක්සේ ඔප්පු කරන ලදී. එම ශරීර කොටස් දෙකකට බෙදා පොළව මත තබන ලදී. සාමාන්‍ය සිරිතේදී දෙපක්ෂය ඒ කැබලි මැදින් යා යුතු විය. මෙය ඉටු කිරීම තද බැඳීමක් විය. මෙහිදී දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට යම්දෙයක් පොරොන්දු වූයේය. ඔහු කැබලි මැදින් ගමන් කළේය. ආබ්‍රහම් දුටුවේ තද කරුවල මධ්‍යයේ දුම් දමන ගිනි හැලියක් සහ ඇවිලෙන පන්දමකි. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ප්‍රකාශවීම මීට ප්‍රථම එවැනි ආකාරයකින් කර තිබුණි. ආබ්‍රහම් සෑහීමට පත්වුණි. මෙසේ ස්ථිර කරන ලද ගිවිසුමක් කැඩිය නොහැකි විය.

කාලය ගෙවිණ. ආබ්‍රහම් දෙවියන්වහන්සේගේ දැනුමෙන් වැඩිණ. පොරොන්දු නැවත ප්‍රකාශ කරන ලදුව තවත් ප්‍රසාරණය කෙරිණ. කරුණු දෙකක් නොවෙනස්ව ගිවිසුම හරහා දිවිය. දේශය උරුම කර ගැනීම සහ ඔවුන්ගේ පරපුරේ අනාගතයයි. මෙම පොරොන්දු පිළිබඳ විස්තර උප්පත්ති 13, 15, 17 සහ 22 යන පරිච්ඡේදවල එයි. වඩාත්ම සිත්ගන්නා පොරොන්දුව වූයේ අවසාන එකය. මෙය දිවිරීමකින් ආරම්භ වේ. "මම මා ගැනම දිවුරුවෙමි" දෙවියන්වහන්සේ පවසති. එය පලපුරුදු අන්දමකින් පවසමින්, "මම නුඹේ බීජ

අහසේ තරු මෙන්ද, මුහුදේ වැලි මෙන්ද, වැඩි කරන්නෙමි." ගුප්ත භාවයකින් අවසන් කරමින්, "නුඹේ බීජය සතුරාගේ දොරටුව ගන්නේය. සහ නුඹේ බීජය තුළින් පොළවේ සියළු ජාතීන් ආශිර්වාද ලබන්නෝය" (උත්පත්ති 22:17-18)

එතැන බහුවචන "බීජ" හෝ "පැවතෙන්නන්" වෙනුවට, ඒකවචන බීජය හෝ පැවතෙන්නා ලෙස වෙනස්වූ අයුරු බලන්න. ඔහුගේ වැදගත් භාවයද සලකන්න. "දොරටුව අයිතිකරගන්නේය" යනු හෙබ්‍රෙව් කියමනකි. පුරාණ කාලයේදී දොරටුව වනාහි ප්‍රාකාර සහිත නගරයට ඇතුළුවන එකම මඟ විය. එය පාලකයන් විනිශ්චය කළ ස්ථානයද විය. සතුරාගේ දොරටුව ගන්නේය යනු, සම්පූර්ණ පාලනය ගන්නේය යනුයි. ආබ්‍රහම්ගෙන් පැවතෙන්නා සම්පූර්ණ ජයග්‍රාහිත්වය සහ විශ්ව ප්‍රීතිය ගෙනෙන්නෙකු විය. දෙවියන්වහන්සේගේ සිත්හි තිබුණේ කවුරුන්ද? ආබ්‍රහම්ට හැකිවුයේ අනුමාන කිරීම සහ විශ්වාස කිරීම පමණකි.

ගිවිසුම සිදුකර වසර 25කට පසුව සාරා මහත් කලබලයකින් පැමිණ ආබ්‍රහම්ට පැවසුවේ ඇයට බිළිඳකු ලැබෙන්නට යන බවයි. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පොරොන්දු ඉටුකරමින් සිටිසේක. මේ කාලය අතරතුර දෙවියන්වහන්සේ ඔහුට පුතෙකු දෙන බව ආබ්‍රහම් නිසැකවම විශ්වාස කළේය. අපෝස්තුළු පාවුල් තුමා මේ ගැන රෝමවරුන්ට ලියන ලද ලිපියේ සඳහන් කරයි. "ඔහු දෙවියන්වහන්සේගේ පොරොන්දුව පිළිබඳ සැකයක් ඇති නොකළේය. නමුත් ඔහු වඩාත් විශ්වාසය වර්ධනය කළේය. දෙවියන්හට පොරොන්දුවූ දෙය කිරීමට හැකි බව සම්පූර්ණයෙන්ම විශ්වාස කළේය." (රෝම 4:20-21) ආබ්‍රහම්ගේ විශ්වාසය නොසෙල්වූ එකක් විය.

## උරුමය තවමත් නැත

මේ මහා පුරෝගාමියාගේ චරිතයේ එකම කරදරකාරී ප්‍රශ්නය වූයේ ඔහුගේ මරණය වේලේවත් ඔහුට උරුම වීමට දේශය නොතිබීමය. දෙවියන්වහන්සේ කිහිපවතාවක් පෞද්ගලිකව ඔහුට සහ පැවතෙන්නන්ට එය පොරොන්දුවී ඇත. ධර්මය නිසා ඝාතනය කරන ලද ස්තේෆන් පවසන පරිදි, දෙවියන්වහන්සේ එහි එක් පියවරක් තබන්නට පමණක්වත් ඔහුට උරුමය නොදීය. (ක්‍රියා 7:5) ආබ්‍රහම් කිසිවිටෙකත් හිමි නොකරගෙන තමාගේ කූඩාරමේ මිය ගියේය. එහෙත් ආබ්‍රහම් දෙවියන්වහන්සේ කෙරෙහිවූ විශ්වාසය නිසා කෙසේ හෝ මේ බාධාව මැඩ ජයගන්නා බව දුටුවේය. හෙබ්‍රෙව්හි ලේඛකයා කියන පරිදි, ඔහු තම බිරිය සහ දරුවන් සමඟ "පොරොන්දු නොලැබ, දුරදී ඒවා දැක ප්‍රසන්නවී, පොළවෙහි තමන් විදේශීන්ද, ආගන්තුකයන්ද බව කියාදී ඇදහිල්ල ඇතිව මැරුණෝය" (හෙබ්‍රෙව් 11:13)

ආබ්‍රහම්ට "විශ්වාසවන්තයන්ගේ පියා" යැයි කිවේ ඇයි කියා ඔබට තේරුම් ගත හැක. දෙවියන්වහන්සේ ඔහු පොරොන්දුවූ දේශයට ගෙනැවිත්, ඔහුට පුත්‍රයෙකු දී ඇත. ඉතින්, දෙවියන්වහන්සේ ඔහුට දේශය උරුමකර දෙන්නේ යැයි කිවේ නම්, ඔහු එය විශ්වාස කළේය. ඔහු මරණයට මුහුණ දීමට සිටියද, ඔහු විශ්වාස කළේය.

ආබ්‍රහම් මිය ගොස් සියවස් සතරකට පසුව, ඔහුගේ පවුල ජාතියක් වශයෙන් වර්ධනයවී තිබුණි. දෙවියන්වහන්සේ ඔහුගේ පුත් ඊසාක්ට දේශය ගැන පොරොන්දුව නැවත දෙන ලදී. නැවත ඔහුගේ මුණුබුරු යාකොබ්ටද, එය පරපුරේ පොරොන්දුව විය. යාකොබ්ට දෙවන නමක් විය. එය ඊශ්‍රායෙල්ය. ඔහු පුතුන් දොළසක් ලැබුවේය. සෑම කෙනෙක්ම දහස් ගණන් සාමාජිකයෝ සිටි ගෝත්‍රයක නායකයා විය. සාගත කාලයක මේ පවුල මිසරයට ගොස් එහි විසුවෝය. ඔවුන් වර්ධනය වන විට ඔවුන්ගේ බලය ගැන මිසරයන් බිය විය. ඔවුහු වහල් කමෙහි යෙදෙවූහ. මහා ව්‍යවස්ථාදායකයාවූ මෝසෙස් ඔවුන් නිදහස් කිරීමට යවන ලදී. බොහෝ විපත් වලින් ඔහුගේ රට වැනසුණු පසු මිසරයේ පාරාවෝ ඔවුනට යාමට බල කළේය. ඊශ්‍රායෙල්වරු පාලු ජනශූන්‍ය දේශය මැදින් තමන්ගේ පොරොන්දු දේශයට යාටම පිටත් වූවෝය. පුදුම සහගතව මේ සිදුවීම ආබ්‍රහම්ට දුන් පොරොන්දුවල කල් ඇතිව කියා ඇති බැව් ඔබට උත්පත්ති 15:13-16 පරීක්ෂා කිරීමෙන් පෙනේ.

## ඊශ්‍රායෙල් සඳහා දෙවියන්වහන්සේගේ දිවීරීම

සිනායි කන්දේදී දෙවියන්වහන්සේගේ දූතයෙක් තවත් පොරොන්දුවක් කළේය. මෙවර එය සියළු ඊශ්‍රායෙල් සමඟ විය. රුධිරයෙන් මුද්‍රා තබන ලද, එය ඊශ්‍රායෙල් දේශයට යතුරක් බඳුය. මෙය, මේ බුද්ධිමත් අණ කිරීම් වූ දේව නීතිය ඔවුහු පවත්වනතෙක් පමණක් විය. වසර ගණනකට පසුව ඔවුන් පොරොන්දු දේශයේ වලිපත්ත මතදී, දෙවියන්හන්සේ වසර සියගණනකට පසුව තම වචනය ඉටු කිරීමට යන බැව් මෝසෙස් ඔවුනට සිහිගැන්විය. "සමිඳානන්වහන්සේ ඔබට ප්‍රේමකළ බැවින්, ඔබේ පියවරුන්ට උන්වහන්සේ දිවූල පොරොන්දුව ඉටුකිරීමට කැමතිවූ බැවිනුත්, උන්වහන්සේ සිය බාහු බලය පෙන්වා ඔබ මුදාගෙන අවුත්......." ඔහු තවදුරටත් කියමින්, "එබැවින් නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ දෙවියන්වහන්සේ බවද, උන්වහන්සේට ප්‍රේමකරමින් උන්වහන්සේගේ ආඥා පවත්වන්නන් සමඟ පරම්පරා දහසක් දක්වා ගිවිසුම සහ කරුණාව පවත්වන්නාවූ විශ්වාසවන්ත දෙවියන්වහන්සේ බවද.." (ද්විතීය කථාව 7:8-9)

එය විශ්මය දනවන ප්‍රකාශයක් විය. සාමාන්‍ය පරම්පරාවක් ගත වර්ෂ කාලක් පමණ පවතියි. එවිට මෙම පොරොන්දුව ඉටු කිරීමට පරම්පරා දහසක් පමණ, වසර දෙදහස් පන්සියයක් දක්වා ගනු ඇත. දෙවියන්වහන්සේගේ පොරොන්දු ඒතාක් විශ්වාසවන්ත විය. ඇත්තෙන්ම දෙවියන්වහන්සේගේ පොරොන්දුවලින් විශාල සංඛ්‍යාවක් නොසෙල්විය හැකි ලෙස සත්‍ය විය. ඊශ්‍රායෙල් ජනතාව යෝර්දාන් නදිය තරණය කොට තම පිතෘදේශයේ කඳු හා තණ බිම් වලට ආවෝය.

අපි අසාමාන්‍යය සිදුවීම් වලින් තොර සියවස් කිහිපයක් පසුකොට ඊශ්‍රායෙල් රාජ්‍ය කාලයට පැමිණෙන්නෙමු. ගීතාවලියේ කතෘ ලෙස හොඳින් දන්නා දාවිත් රජු. ආබ්‍රහම් මෙන්ම විශ්වාසයේ යෝධයෙකු විය. දෙවියන්වහන්සේ පිළිබඳව ඔහුගේ ආදරය, ඔහුගේ සත්‍යය සහ යුක්තිය, ඔහුගේ ලියවිලි වලින් පෙනේ. ශුද්ධ ලියවිලිවල ආබ්‍රහම් ගැන නිතර සඳහන් කරන්නේ දෙවියන්වහන්සේගේ "මිත්‍රයා" වශයෙනි. දෙවියන්වහන්සේ දාවිත් ගැන කථා කළේ "මාගේ හදවත වැනි මිනිසෙකු ලෙසිනි. මේ "ප්‍රකාශන" මිනිසුන් දෙදෙනාම පිළිගත හැකි චරිත ඇත්තවුන් බැව් පෙන්වයි.

කාන්තාරයේ ඇවිදින කාලයේදී සහ දේශය හිමිකර ගැනීමෙන් පසු ඊශ්‍රායෙල්වරු දෙවියන් වන්දනා කළේ මණ්ඩපකය. එය කූඩාරමක් බඳු, ගෙනයා හැකි ගොඩනැගිල්ලකි. දැන් ඔවුන් රජෙකු සහ යෙරුසලම ප්‍රධාන නගරය කරගත් මනාව ගොඩනැගුණු ජාතියකි. දාවිත්, දෙවියන්වහන්සේට වඩාත් ස්ථිරවූ, ගලෙන් කරන ලද දේවස්ථානයක් ඉදිකිරීම හොඳ යැයි කල්පනා කළේය. මෙය අනාගතවක්තෘ නේතන්ට යෝජනා කළ විට, ඔහුගේ පුත්‍රයා සිහසුනට එනතෙක් එම අදහස කල් දැමීමට කීමෙන් ඔහුගේ බලාපොරොත්තු කඩ විය. කෙසේ හෝ, දෙවියන්වහන්සේ දාවිත්ගේ යෝජනාවට ප්‍රියවූ නිසා, ස්වාමින්වහන්සේ දාවිත් ගැන සලකා ඔහු සහ ඔහුගේ පවුල සඳහා සැලකිය යුතු පොරොන්දුවක් කළේය. එය ආබ්‍රහම් සමඟ කළ පොරොන්දුවට බොහෝ සමානය.

## දාවිත් රජු සමඟ ගිවිසුමක්

එය එතරම්ම උදාර පොරොන්දුවක් වන හෙයින් එයට දාවිත් සමඟ කළ ගිවිසුම යැයි කියනු ලැබේ. එය ආබ්‍රහම් සමඟ කළ ගිවිසුම මෙන් ක්‍රියාත්මක සහ ගුප්ත බවකින් සමානවූ අතර මෙය වසර ගණනක් යනතුරු දාවිත්ට ප්‍රහේලිකාවක් වන්නට ඇත. උදාහරණයක් මෙන්න, 2 සාමුවෙල් 7 : "ස්වාමින්වහන්සේ නුඹට වංශයක් (ගෘහයක්) සාදා දෙන බව දන්වන සේක."

(පදය 11). එය විකාර කියමනක් සේ පෙනුනේ දාවිත් විසින් දෙවියන්වහන්සේ උදෙසා ගෘහයක් තැනීමට උවමනාවූ නිසාය. නමුත් දිව්‍යස්වරයා දිගටම කථා කරමින්, ස්වාමීන්වහන්සේගේ සිත්තුළ ඇත්තේ වෙනත් ආකාර ගෘහයක් බැව් පෙන්වයි. "මම නුඹෙන් පැවත එන නුඹේ බීජය නුඹට පසුව පිහිටුවා ඔහුගේ රජකම ස්ථිර කරන්නෙමි. ඔහුම මාගේ නාමයට ගෘහයක් ගොඩනගන්නේය. ඔහුගේ රජකමේ සිංහාසනයද සදාකාලේටම ස්ථිර කරන්නෙමි." (12,13 පද).

මේ දක්වා පොරොන්දුව බොහෝ දුරට පැහැදිලි අතර දාවිත්ගේ පුත් සොලමන් සිංහාසනය ලබා ගත්තේය. නමුත් දෙවියන්හන්සේ මෙසේ පවසයි. "මම ඔහුගේ පියා වෙමි. ඔහු මාගේ පුත්‍රයා වන්නේය. (14පදය) මෙය ගැටළුවක් විය. දාවිත්ගේ පුත්‍රයා යැයි කී අය සම්බන්ධ, දෙවියන්වහන්සේ ඔහුගේ පියා විමද ගුප්ත නොවන්නේද? පොරොන්දුවේ උච්චතම අවස්ථාව අන්තිමේදී පැමිණුන : "නුඹේ වංශයද, රාජ්‍යයද මා ඉදිරියේ සදාකාලිකව පිහිටුවන්නෙමි. නුඹේ සිංහාසනය සදහටම පිහිටුවන්නෙමි" (16 පදය) දාවිත්ගේ ගෘහය පැහැදිලිවම ඔහුගේ පවුල හෝ රජ පෙලපතයි. අපිද මෙම ක්‍රමය ඉතිහාස පාඩම් වලදී පාවිච්චි කරමු. ඒ අප, වින්සර් ගෘහය (ඉංග්‍රීසි රජ පෙලපත) හෝ රාජසිංහ ගෘහය (සිංහල රජපෙලපත) ගැන කියවන විටය.

කෙතරම් බලවත් පොරොන්දුවක්ද - තම පරම්පරාවල් නොකඩවා සිංහාසනය ලබාදීමේ පොරොන්දුව වසර සියගණනකට නොව, සදහටමය ! එය දාවිත් සිය ජිවිතයේ ඉතිරි කාලය තුලම ප්‍රීතිමත් වන තරමේ ගිවිසුමක් විය. "මම ස්වාමීන්වහන්සේගේ කරුණාව ගැන ගී ගයන්නෙමි" යි හෙතෙම ගීතාවලිය 89 දී ලියයි. "මාගේ ගිවිසුම කඩ නොකරන්නෙමි"යි දෙවියන්වහන්සේ පවසයි. "මාගේ ශුද්ධකම කියා එක් වරක් දිවුරිමි. දාවිත්ට බොරු නොකියමි. ඔහුගේ වංශය සදාකල්ද, ඔහුගේ සිංහාසනය මා ඉදිරියෙහි සූර්යයා මෙන්ද පවතින්නේය." (1, 34-36 පද)

තවත් වරක් දෙවියන්වහන්සේ, උන්වහන්සේගේ ගෞරවය නිසා කඩකල නොහැකි පොරොන්දුවක් විය. ආබ්‍රහම් සහ දාවිත්, සදාකාලිකව දෙවියන්වහන්සේ තමාගේ වචන ඉටු කරන්නේය යන විශ්වාසයෙන් මිය ගියෝය.

දැන් අප තවත් සියවස් පහක් වේගයෙන් ඉදිරියට ගොස්, අපෝස්තුළු පේදුරු පවසන "දෙවියන්වහන්සේගේ අති මහත් වටිනා පොරොන්දු" (2 පේතෘස් 1:4) අවස්ථාවට එමු. එය ප්‍රීතිමත් අවසානයක් සහිත කාර්යයකි.

## නැවත පිහිටුවන පොරොන්දු

දාවිත්ගේ පුත් සොලමන් දෙවියන්වහන්සේට ගෘහයක් ඉදිකළේය. මහත් වියදමකින් හා තේජසින් යුතුවූ යෙරුසලමේ පිහිටි දේවමාලිගය වසර සියගණනාවක් පැවතුණි. ඔහු මියගිය විට, බිහිසුණු සිවිල් යුද්ධයකින් රට දෙකඩ විය. ජාතිය විරුද්ධ රජවරු දෙදෙනෙකු විසින් පාලනය කරන ලදී. කල් යැමේදී මිනිසුන්ගේ අධ්‍යාත්මික බලය පිරිහී දෙවියන්වහන්සේගේ නිතිය නොසලකා හැරිණ. වරින් වර උද්යෝගිමත් යුගයන්වූ නමුත් ඒවා ප්‍රධාන වශයෙන් දේවමාලිගය සහ අගනුවරවූ යෙරුසලමට අයත්වූ බෙන්යමින් සහ යුදා ගෝත්‍රවල පමණි. ක්‍රමයෙන් ආචාරශීලී තත්වයේ බැස්මක්වූ අතර, දෙවියන්වහන්සේගේ ඉවසීම අවසන් විය. ඊශ්‍රායෙල් දේශයේ හිමිකම ඔවුනට ලැබුනේ උන්වහන්සේ කෙරෙහි දැක්වූ කීකරුකම මතය. ඔවුහු නින්දිත ලෙස තමන්ගේ පිළිගත් ප්‍රතිපත්ති කැඩුහ. මෙය දිවැස්වරුන්ගේ යුගය විය. ඔහුගේ සත්‍යයේ භාවයට, දෙවියන්වහන්සේ තුළ ඇති මහත් කරුණාව පෙන්වමින්, විශේෂ දූතයන් යවමින් ශුද්ධාත්මයේ මෙහෙයවීමෙන් ජනයාට අවවාද කළේ ඔවුන් යන්නාවූ මාර්ගය මහත් අනතුරකට මුහුණ දෙන මාර්ගයක් බව පෙන්වමිනි.

අවවාදය ප්‍රතිඵල ගෙන දුන්නේ නැත. අවසානයේදී ගෝත්‍ර දසය ඇසිරියානුවන් විසින් ආක්‍රමණය කරනු ලදුව සම්පූර්ණයෙන්ම රටින් පිටුවහල් කරන ලදී. තව ශත වර්ෂ එකහමාරක් පසුව්, ඉතිරි ගෝත්‍ර දෙක බැබිලෝනියාවට ගෙන යන ලදී. ඇත්තෙන්ම එය අවසානය සේ පෙණුනි. අලංකාර දේවමාලිගය ගිනිතබා රජමාලිගය විනාශ කිරීමෙන් පසු, දාවිත්ගේ සිහසුනේ සිටි 19 වැනි රජු සෙදකියා අන්ධකොට ගෙනයන ලදී. ඔහුගෙන් පැවතෙන්නන් දේශය උරුමකර ගන්නා බැව් ආබ්‍රහම්ට වූ පොරොන්දුවට කුමක්විද? ඔහුගේ සිහසුන අයත් කර ගැනීමට සැමවිටම කිසිවකු නැති නොවන බැව් කී පොරොන්දුවට කුමක්විද? දෙවියන්වහන්සේට උන්වහන්සේගේ පොරොන්දු අමතක විද? නැතහොත් බැබිලෝනියාවේ ජාතින්ගේ දෙවිවරුන්ට වඩා උන්වහන්සේගේ බලය අඩුවිද? මිනිසුන්ට මහ පෙන්වීමක් අත්‍යාවශ්‍ය විය.

ඊශ්‍රායලයේ ආලෝකය බොඳවන්නාවූ මේ පැයේදීම, පුදුමයකට මෙන් අනාගතවක්තෘන් ඔවුන් හට අප්‍රමාණ පොරොන්දු රාශියක් ප්‍රකාශ කිරීමට පටන් ගති. ඔවුන් ප්‍රකාශ කළේ මේ අයහපත් සිදුවීම් හදිසියේ පැමිණියා නොව දෙවියන්වහන්සේගේ විනිශ්වය මගින් පැමිණි බවයි. දඬුවමින් ගැලවීමක් නොතිබුණු නමුත් තවමත් අනාගතය ගැන බලාපොරොත්තු තිබිණ. ජාතිය විනාශ නොවනු ඇත. දාවිත්ගේ සිංහාසනයේ ආණ්ඩු කිරීමට රජකෙනෙකු

සිටිනවා ඇත. යම් දිනෙක ස්වාමින්වහන්සේ, මහත් ගැලවුම්කරුවකු වන මෙසියස් එවා, ඔහු මගින් ඔවුන් ආපසු දේශයට ගෙන අවුත් සදාකල් සාමයෙන් ඉන්නට සලස්වනු ඇත.

## <u>මෙසියස්වහන්සේ ගැන යෙසායාගේ අනාවැකි</u>

මේ කාලයේ දෙවියන්වහන්සේ විසින් කළ පොරොන්දු කිහිපයක් මෙහි උපටා දක්වමු. ඒවා වෙනස් දිවැස්වරුන් තිදෙනෙකුගෙන් ගන්නා ලදී.

යෙසායා ජීවත් වූයේ අවසාන කාලයට පෙර හෙයින් ඔහුට සිදුවන්නට යන දේ දැකිය හැකි විය. ඔහුගේ ආරම්භක පරිච්ඡේදයේ ඔහු මෙසේ පවසයි.

"අහෝ පාපිෂ්ඨ ජාතියක්ද, අපරාධයෙන් බර සෙනගක්ද..... ඔවුහු ස්වාමින්වහන්සේ අමතක කළහ. ඔවුහු ඊශ්‍රායෙල් ශුද්ධ තැනන්වහන්සේට නිගරු කලහ. මුළු හිස රෝගී විය. හදවත මුළුමනින්ම දුබල විය. ආත්මය පයේ සිට හිස දක්වා තිහඬව ඇත." (1:4-6) නමුත් මේ පොතේ මුළු පරිච්ඡේදවල ප්‍රමාණවත් ලෙස ප්‍රසංගා සහ දෙවියන්වහන්සේගෙන් එන ගලවා ගැනීම් ගැන ස්තුති කිරීම් ඇත. "නුඹලා දූවිලි ගසා දමා නැගුනාහුය. නාස්ති කල යෙරුසලමේ නුඹලා ගී ගයන්නාහුය. මක්නිසාද, ස්වාමින්වහන්සේ ඔහුගේ සෙනගට පහසුවක් දී ඇත. ඔහු යෙරුසලම ගලවා ඇත." ජනතාව මුදවා ගැනීමට දෙවියන්වහන්සේ ගින්නෙන් සහ භූමිකම්පාවෙන් එනවිට, ඔවුන් පළිගන්නා ජාතීන් විසින් පාගා දමමින් සිටින බැව් උන්වහන්සේ දක්නා සේක. උන්වහන්සේ මෙසේ පවසයි. "ආක්‍රමණය කරන හමුදාවේ පාවහන්ද, ලෙයින් තැවරුණු ඔවුන්ගේ ඇඳුම් සියල්ලද, ගින්නෙන් දවාලනු ලැබේ." තවදුරටත් පවසමින්," අපට බිළිඳෙක් උපන්නේය. අපට පුතෙක් දෙන ලද්දේය. ආණ්ඩුව ඔහුගේ කර මතය. ඔහුගේ නාමය අපූර්වය. මන්ත්‍රීවරයාය. පරාක්‍රමවත් දෙවියන්වහන්සේය. සදාකාලික පියාණෝය. සමාදානයේ කුමාරයාණෝ යැයි කියනු ලබන්නේය. මෙතැන් පටන් සදාකාලයටම <u>දාවිත්ගේ සිංහාසනයත්, ඔහුගේ රාජ්‍යයත්, යුක්තියෙන්ද, ධර්මිෂ්ඨකමින්ද, ස්ථිරකර පිහිටුවනු පිණිස ඒවා කෙරෙහි උන්වහන්සේගේ ආණ්ඩුවේ විශාලත්වයටත් සමාදානයටත් කෙලවරක් නොවන්නේය."</u> (9 : 5-7)

ඔහු පෙන්වන්නේ දාවිත්ගෙන් එන මේ රජු ලෝක ව්‍යාප්ත ආණ්ඩුවක සියළු ජාතීන් සාමයෙන් පාලනය කරන බවයි. දෙවියන්වහන්සේගේ නීතිය යෙරුසලමේ සිට ලොව පුරා යනු ඇත. "මතු දවස්වලදී" යනුවෙන් ඔහු

පටන්ගෙන: "මක්නිසාද, ව්‍යවස්ථාව සියොනෙන්ද, ස්වාමීන්වහන්සේගේ වචනය යෙරුසලමෙන්ද, නික්ම යන්නේය. උන්වහන්සේ ජාතීන් අතර විනිශ්චය කොට, බොහෝ ජනයන්ගේ කාරණා නිශ්චය කරන සේක. ඔවුහු තමුන්ගේ කඩුවලින් හී වැල්ද, හෙල්ලවලින් දෑකැතිද, තලාගන්නෝය. ජාතියක් ජාතියකට විරුද්ධව කඩුව ඔසවන්නේවත් තවත් යුද්ධ ඉගෙන ගන්නේවත් නැත." (2:2-4). යෙරුසලම වැටුණු යුගයේ ජීවත්වූ යුදෙව්වෝ මේ අනාවැකි ඉටුවීම නොවනු ඇතැයි සිතුවා විය හැක. නමුත් පරම්පරා දහස් ගණනකට වචනය ඉටු කරන දෙවියන්වහන්සේ ඔවුනට පොරොන්දු විය.

## යෙරමියා සහ අලුත් පොරොන්දුව :

අපගේ දෙවැනි ප්‍රොපේතවරයා ඇත්තෙන්ම යෙරුසලමේ විනාශය අවස්ථාවේදී ජීවත් වුවෙකි. නගරය වනසා එහි ජනතාව රැගෙන යනු ඔහු දුටුවේය. එහෙත් දෙවියන්වහන්සේ පැරණි ගිවිසුමේ ඉතා පැහැදිළි ප්‍රොපේතවරයෙකුවූ යෙරමියා මගින් ඔහුගේ සෙනඟගේ අනාගතය පැහැදිළි කරයි. "බලව, මා විසින් ඊශ්‍රායෙල් වංශය සහ යුදා වංශය සමඟ අලුත් ගිවිසුමක් කරන දවසේ පැමිණෙන්නේ යයි ස්වාමීන්වහන්සේ කියනසේක. ඒ වනාහි මිසර දේශයෙන් ඔවුන්ගේ පියවරුන් ගෙනෙන පිණිස මා ඔවුන්ගේ අත අල්ලූ දවසේදී ඔවුන් සමඟ කළ ගිවිසුම වාගේ නොවේය."

පැරණි පොරොන්දුව ජාතිය සමඟ සිනයිහිදී කළ එකක් විය. එය කොන්දේසි මත පොරොන්දු දේශය දුන් එකක් විය. අලුත් පොරොන්දුව, පැරණි පොරොන්දුව වෙනුවටය. "නමුත් ඒ දවස් වලට පසු මා ඊශ්‍රායේල වංශය සමඟ කරන ගිවිසුම මේ යැයි ස්වාමීන්වහන්සේ කියන සේක. මම මාගේ ව්‍යවස්ථාව ඔවුන් තුලම තබා, එක ඔවුන්ගේ සිත්වල ලියන්නෙමි. මම ඔවුන්ගේ දෙවියන්වහන්සේ වන්නෙමි. ඔවුහුද මාගේ සෙනඟ වන්නෝය." උන්වහන්සේගේ ව්‍යවස්ථාව ගල්පුවරු මත තිබෙනු වෙනුවට එය මිනිසුන්ගේ හදවත් වලට ගෙනෙනු ලැබීය. මිනිසුන් සියළුදෙනා දෙවියන්වහන්සේ දැනගනු ඇත. දෙවියන් ඔවුන්ගේ වැරදිවලට සමාව දෙනු ඇත. ඔවුන්ගේ පව් නැවත සිහිනොකරනු ඇත. (යෙරෙමියා 31:31-34)

ඒ සියල්ල බැබිලෝනියේ වහල්කමට යාමට පිටත්වූ සියල්ලන්ටම ඇසීමට අකමැතිවූ නමුත්, යෙරමියා මේ වචනවලින් ඔවුන් දිරිමත් කරයි. "මාගේ උදහසින් .... මා විසින් ඔවුන් පන්නා දැමූ රටවලින් ඔවුන් රැස්කර නැවත මේ ස්ථානයට පමුණුවා සුවසේ වාසය කරන්නට සලස්වන්නෙමි.... මාගේ මුළු සිතෙන්ද, මුළු ආත්මයෙන්ද, මේ දේශයෙහි ඔවුන්

පිහිටුවන්නෙමි" (32:37,41). මෙම පොරොන්දුව යෙරමියා නැවත නැවතත් පවසයි. ඔවුන්ගෙන් ගන්නා ලද රජු කෙරෙහි විශ්වාසය නොතැබුවද, නැවත ඔවුන්ගේ සිහසුන ආරක්ෂිතයැයි කියයි. "මම දාවිත්ට ධර්මිෂ්ඨකමේ ශාඛාවක් ලියලවන්නෙමි. උන්වහන්සේගේ ධර්මිෂ්ඨකමත් යුක්තියත් දේශයෙහි ඉෂ්ඨකරනවා ඇත... ස්වාමින්වහන්සේ මෙසේ කියන සේක. ඉශ්‍රායෙල් වංශයේ සිංහාසනයෙහි හිඳිමට දාවිත්ගෙන් කෙනෙක් කවදාවත් නැතුව නොයන්නේය." (33:15,17)

"යුක්තිය සහ ධර්මිෂ්ඨකම" - අප මේ වචනවල දෝංකාරය අසන්නේ යෙසායා වසර එකසිය පනහක් කලින් කියූ වදන්වලිනි. මේ ප්‍රොපේතවරු දෙදෙනා දාවිත් පවුල් වෘක්ෂයක් මෙන් පෙන්වති. එයින් වැදගත් ශාඛාවක් එන්නේය. අසමසම පුද්ගලයෙකු වන ඔහු සදාකාලයටම සිංහාසනය ලබා ගන්නේය. ස්ථිරවම, මේ ප්‍රොපේතවරු දෙදෙනාම තුළ ඇත්තේ ආබ්‍රහම්ගේ දේශය පිළිබඳ පොරොන්දුවය. විසුරුවා හරින ලද ජනතාව නොසලකා මෙය පවසයි.

## රාජ්‍යය ගැන එසකියෙල්ගේ දර්ශනය

අන්තිමේදී අපි තවත් පසුකාලීනව ජීවත්වූ එසකියෙල් වෙතට එමු. ඔහු තමන්ගේ මුළු ජීවිතයම යුද්ධ සිරකරුවෙකු වශයෙන් බැබිලෝනියේ විසිය. ඔහුටද, වඩාත් පුදුමවූ, ආබ්‍රහම්ගේ ජනතාවට සාමය සහ ආශිර්වාදය පිළිබඳ දර්ශනයක් විය. "මම ජාතීන් අතරෙන් නුඹලා රැගෙන, සියළු දේශවලින් නුඹලා රැස්කර, නුඹලාගේම රටට ගෙනෙන්නෙමි." ඔහු අනාගතවාක්‍යය පවසයි. "නුඹලා පිරිසිදු වන පිණිස මම නුඹලා කෙරෙහි පිරිසිදු දිය ඉසින්නෙමි. නුඹලාගේ සියළු අපවිත්‍රකම්වලින්ද... පිරිසිදු කරන්නෙමි." දෙවියන්වහන්සේ ජාතියේ වැරදි ක්ෂමා කිරීමටත්, ඒවා අමතක කිරීමටත් ගියහ. (එසකියෙල් 36 : 24,25). කලින් ප්‍රොපේතවරු මෙන්ම, එසකියෙල්ද පැමිණෙන්නාවූ රජු ගැන ඊශ්‍රායෙල් මිමුත්තන්ට ගායනා කරයි. "මාගේ සේවකයාවූ යාකොබ්ට මා දුන්නාවූ, නුඹලාගේ පියවරුන් වාසය කළාවූ දේශයෙහි ඔවුන් වාසය කරනවා ඇත. එසේ ඔවුන් සහ ඔවුන්ගේ දරුවෝද ඔවුන්ගේ දරුවන්ගේ දරුවෝද සදාකාලේටම එහි වාසය කරන්නෝය. මාගේ සේවකයාවූ දාවිත්ද සදාකාලේටම ඔවුන්ට අධිපතියා වන්නේය." (37:25). දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ජනයාට දුන් පොරොන්දුවල නිර්මලකම හා ශක්තිමත්කම ගැන කිසිදු සැකයක් නැත. කෙසේ හෝ අඳුරු වර්තමානයේ සිට ඔවුනට අනාගතයේ කිසියම් වෙනසක් බලාපොරොත්තු වීමට ඇත.

සියවස් තුන්කාලක් ඊශ්‍රායෙල්වරු බැබිලෝනියේ වහල්ලු වුහ.

විප්ලවයක් විය බැබිලෝනි අධිරාජ්‍යය පර්සියානුවන් විසින් ගන්නා ලදී. නව රජුගේ පළමුවෙනි වර්ෂයේ ඔහු සමාවක් දුනි. යුදා වර්ගයේ ඕනෑම කෙනෙකුට නැවත තම රට යෑමට හැකිවිය. බොහෝ දෙනා ගියෝය. ඔවුහු වල් බිහිවී තිබූ තම දේපල ප්‍රතිසංස්කරණය කිරීමට පටන්ගති.

සමහර විට මෙසියස් ඔවුනට ජීවිතය පහසු කිරීමට එනු ඇතැයි ඔවුන් බලාපොරොත්තු විය. ඔවුන් වහල්කමින් ආපසු ගොස් තිබූ බැව් සත්‍යය නමුත් ජීවිතය තිබුණු විධියට නොවිය. ඔවුන්ගේ උසස් නිලධාරින්ගේ බඳු යටතේ ඔවුහු පොඩිකර දමනු ලැබූහ. ඔවුන්ගේ සහෝදරයන්ගේ මහත් වැඩි පිරිසක් නවාතැන් නොමැතිව නවදූරටත් ජාතින් අතර ඇවිදිමින් උන්හ. දාවිත්ගේ සිංහාසනය මත රජෙකු හිඳ ගත්තේ නැත.

## යේසුස්වහන්සේගේ පැමිණීම

විවාහ නොවූ නමුත් ඔහදුන් යුදා වංශයේ තරුණියක් තම නිවසේ හිඳගෙන සිටියාය. හඬකින් විශ්මිතවූ ඇය, තමන් දෙවියන්වහන්සේගේ දූතයෙකු සමඟ කථා කරන බැව් වටහා ගත්තාය. "නුඹ ගර්භණීව පුත්‍රයෙකු වදන්නියයි" ඔහු ඇයට කීය. "උන්වහන්සේට යේසුස් යන නාමය තබාපන්න". මෙම වදන් නත්තල් නාට්‍යය වල අපට පුරුදුය. නමුත් පණිවිඩයේ ඉතිරි කොටස කල්පනා කර බලන්න. "උන්වහන්සේ උතුම්ව මහෝත්තමයාණන්ගේ පුත්‍රයාණන් කියනු ලබනසේක. උන්වහන්සේගේ පියවූ දාවිත්ගේ සිංහාසනය දෙවිවූ ස්වාමීන්වහන්සේ උන්වහන්සේට දෙනසේක. උන්වහන්සේ යාකොබ්ගේ වංශය කෙරෙහි සදාකාලේටම රජකම් කරනසේක.

උන්වහන්සේගේ රාජ්‍යය කෙළවර නොවන්නේය "(ලූක් 1:31-33 එහි කිසිදු වැරදීමක් නොමැත. දේවදූතයාගේ වචන පැරණි ගිවසුමේ පොරොන්දු වලට බැඳී ඇති බැව් පැහැදිළිය. "මහෝත්තමයාණන්ගේ මහිමය ඔබ වසා ගන්නේ යැයි ඔහු අවසාන කරයි. "ඒ නිසා උපදින්නට සිටින දරුවා ශුද්ධ යැයිද, දෙවියන්වහන්සේගේ පුත්‍රයා යයිද කියනු ලබන්නේය" (35 පදය)

එක්විටම සියවස් ගණනක අභිරහස පැහැදිළිවන්නට විය. මරියාගේ පුත් යේසුස් අසමසම අයෙක් විය. දාවිත් සමඟ කළ ගිවිසුම සම්පූර්ණ කිරීමට සුදුසු එකම පුද්ගලයා විය. ඇයගේ පවුල් ඉතිහාසයෙන් ඔහු දාවිත්ගේම පවුලෙන් පැවතෙන්නෙකු විය. එසේම ඔහු දෙවියන්වහන්සේගේ පුත්‍රයා විය. "මම ඔහුගේ පියා වන්නෙමියි" දෙවියන්වහන්සේ දාවිත්ට පවසා තිබුණි. දෙවියන්වහන්සේගේ ශුද්ධාත්ම බලයෙන් යේසුස්ගේ උපත සිදුවිය.

යෙරමියා තවදුරටත් මෙසේ පවසා තිබුණි. "ඉශ්‍රායෙල් වංශයේ සිංහාසනයේ හිඳිමට දාවිත්ගෙන් කෙනෙක් කවදාවත් නැතුව නොයන්නේය." දේවදූතයා පැවසුවේ යේසුස් වහන්සේ සදාකාලයටම එම සිංහාසනයේ රජකම් කරන බවය. අවසාන වශයෙන් දාවිත් ආබ්‍රහම්ගෙන් පැවතෙන නිසා, යේසුස්වහන්සේද, එම වංශයේ ආබ්‍රහම්ගේ පොරොන්දුවලට අනුව සියළු ජාතීන්ට ආශිර්වාදයක් මෙන්ම, "ඔහු ඔහුගේ ජනයා පාපයෙන් මුදා ගනු ඇත" ප්‍රකාශණයෙන් ඔහුගේ නමේ අරුත එසේ විය. (මතෙව් 1:21) දුක්, ලෙඩරෝග, මරණය ගෙනදෙන මිනිසාගේ භයානක පාප ඉවත් කිරීමට වඩා තවත් ආශිර්වාදයක් කොයින්ද? එසේ, නිහඬව සහ අතිශෝකයක් නොමැතිව, මුළු ඊශ්‍රායෙලය සහ ලෝකයම බලාපොරොත්තුවූ තැනැත්තා තම පියවූ දාවිත්ගේ වංශයේ නගරයක, ගවහලක උපත ලද්දේය.

## ක්‍රිස්තුස්වහන්සේගේ කාර්යය

යේසුස්වහන්සේ වයස 30 දී ප්‍රසිද්ධ දේශනා පවත්වන විට යුදයේ මහත් බලාපොරොත්තුවක් විය. ඔහුගේ අනුගාමිකයෝ ඔහු මෙසියස් හෝ අභිෂේකලද්දා - පැමිණෙන ගැලවුම්කරු වශයෙන් නම් කළහ. "ක්‍රිස්ටෝස්" හෝ ක්‍රිස්තුස් යන ග්‍රීක් වචනය නවගිවිසුමෙහි යෙදෙන්නේ ඇත්ත වශයෙන්ම පැරණි ගිවිසුම සඳහන් කරන මෙසියස්වහන්සේටය. සැමදෙනාම යේසුස්වහන්සේ රෝමයට අභියෝග කරනු ඇතැයිද, ඊශ්‍රායලය සතුරන්ගෙන් නිදහස් කරගනු අතැයිද සිංහාසනය පිහිටුවනු ඇතැයිද, බලාපොරොත්තු වූහ. ඔහුගේ අති අසාමාන්‍යය හාස්කම් මගින් කළ සුව කිරීම් නිසා ඔහු දෙවියන් විසින් එවන ලද, බවට විශ්වාසය ඇතිවිය.

මිනිසුන්ගේ ඉරණම බලාපොරොත්තු රහිත විය. යේසුස් අනගාරික ගුරුවරයෙකුවූ අතර දේශපාලනය ප්‍රතික්ෂේප කළේය. ඊශ්‍රායෙල් නායකයෝ ඔහුගේ ජනප්‍රියතාවයට ඊර්ෂණා කලහ. සාර්ථක ලෙස ඔහුගේ මරණය කුමන්ත්‍රණය කලහ. වසර තුනකට පසුව ඔහු විසින් ප්‍රතිසංස්කරණය කරන ලද, ජිවිත දහස් ගණනක් ඔහුගේ නිදසුන් සහ යහපත් ඉගැන්වීම් වලින් යහමඟට ගත් අතර, ඔහු පාවා දෙනු ලදුව අපරාධකරුවෙකු ලෙස තීරණය කර ඝාතනය කරන ලදී. යුදෙව්වෝ බලාපොරොත්තුවක් නොමැතිව විසිරී එක් කරනු නොලැබ සිටියහ. දාවිත්ගේ සිහසුන හිස්ව තිබුණි. යේසුස්ගේ සිරුර පවා අතුරුදහන් විය. දෙවියන්වහන්සේ පොරොන්දුවක් දුන් නමුත්, එය ගුණපව් යන බැව් පෙණුනි. දීර්ඝ සති හයක් යෙරුසලම තද නින්දේ පසුවිය.

## අභිරහසේ එළිදරව්වීම

හදිසියේම අගනුවර පුදුම ගුහාරංචියකින් පනගන්වනු ලැබිණ. යේසුස්වහන්සේගේ අනුගාමිකයෝ පැරණි ප්‍රොපේතවරුමෙන් ශුද්ධාත්මයෙන් පිරී, යේසුස් නැවත පිවත්වෙතියි පැවසූහ. ඔවුහු ඔහු දුටුවෝය. ඔහු සමඟ ආහාර අනුභව කළෝය. ඔහු ස්වර්ගයට ඔසවාගනු දුටුවෝය. වඩාත් පුදුමයට, ඔවුහු පැරණි ශුද්ධ ලියවිලිවල මෙසියස්වහන්සේ කුරුසිය මත මියයන බවත්, නැවත නැගිටින බවත් සඳහන්ව ඇති බැව් පෙන්විය. කිසිවක් නොවැරදී තිබුණි. ඒ සියල්ල දෙවියන්වහන්සේගේ සැලැස්ම විය.

"ක්‍රිස්තුස්වහන්සේ දුක් විඳිය යුතු යැයි දෙවියන්වහන්සේ සියළු දිවැස්වරුන්ගේ මුවින් පෙර දන්වා වදාල දෙය, මෙසේ සම්පූර්ණ කළසේක." මසුන් මරන්නෙකුවූ පේදුරු ප්‍රකාශ කළේය. "එබැවින් පව් මකාලන පිණිසද, දෙවියන්වහන්සේ කෙරෙන් නව ජීවන යුගයක් පැමිණෙන පිණිසද, ඔබ උදෙසා පෙර නියම කරන ලද ක්‍රිස්තුස් නම් යේසුස් එවා වදාරන පිණිසද, මනස්තාපව් දෙවියන්වහන්සේ වෙත ආපසු හැරෙන්න. ආදි යුගවල සිට දෙවියන්වහන්සේ ස්වකීය ශුද්ධ දිවැසිවරුන්ගේ මුවින් දැන්වූ, මුළු ලොවට නව ජීවයක් දීමේ කාලය පැමිණෙන තුරු උන්වහන්සේ ස්වර්ගයේ වැඩ විසිය යුතුය." (ක්‍රියා 3:18-21)

නැවත සියල්ල පැහැදිළි වී තිබුණි. ප්‍රොපේතවරුන් කියන ලද පරිදි යේසුස්වහන්සේ ඊශ්‍රායලයේ සහ ලොව සියළු ජාතීන්ගේ ගැලවුම්කරුය. නමුත් ඔහුට දෙවරක් පැමිණීමට සිදුවිය. වරක් පව් දරා සිටින්නකුසේ පැමිණ මිය යාමට වූයේ පාපයේ මහත් සතුරා සහ සදාකාල මරණයේ සතුරා ලෙසින්ය. ඔහු දෙවනවර පැමිණීමට ඇත්තේ ඔහුගේ සෙනඟ සතුරන්ගෙන් ගලවාගෙන ලෝකය පාලනය කිරීමටය. ඔහු දෙවියන්වහන්සේගේ දකුණු හස්තය දෙසට ඔසවාගනු ලැබුවේ සදහටම නොවේ. ඔහු එහි සිටින්නේ ප්‍රොපේතවරු මගින් දෙවියන්වහන්සේ විසින් කියන ලද සියල්ල පිහිටුවා ලබන තුරුය.

මේ යතුරින් මෙසියස්වහන්සේ පිළිබඳ නිධානයේ පෙට්ටගම විවෘත වේ. මෙසියස්වහන්සේගේ පාලනය පිළිබඳ ජයග්‍රහණය දැක්වෙන වදන් ඔහුගේ මරණයේ අඳුරු වලාකුළින් වැසිගියද, සියල්ල පැහැදිළිය. නිදසුනක් වශයෙන් 52 පරිච්ඡේදයේ සහ 53 පරිච්ඡේදය බලන්න. 52 විස්තර කරන්නේ මෙසායා විසින් සතුරන්ගෙන් නිදහස් කරගත් යෙරුසලම ඇගේ ප්‍රීතිය ප්‍රකාශ කිරීමයි. 53 පරිච්ඡේදය අනාවැකි කියන්නේ වේදනාත්මකව ඔහු කුරුසියේ අමානුෂික ලෙස ඇණ ගැසීම පිළිබඳවය. පැමිණීම් දෙකක් මෙන් දුටුවිට, පරිච්ඡේද දෙකම සම්පූර්ණව වැටහේ.

නැත්නම් ගීතාවලිය 2 : එක් උපැස් යුවලකින් පෙනෙන්නේ මෙසියස් වහන්සේගේ සතුරෝ උන්වහන්සේ මරණයට පත් කිරීමට එකතුවන සැටිය. උපැස් යුවලේ නාභිදුර වෙනස් කර බැලුවහොත්, නැවත වරක් සතුරන් විසින් වට කරනු ලැබූ මෙසියස්වහන්සේ සිටී. නමුත් මෙවර ජයග්‍රාහීව ඔහුගේ පියා අණ කරන ලෙස: "මාගේ ශුද්ධවූ කන්ද සියෝන් මත මම මාගේ රජ පිහිටුවමි" (6 වැනි පදය) අපට තව දුරටත් යා හැක. නමුත් ඔබම මේ අභිරහස් විසඳා ගැනීමෙන් මහත් සතුටක් අත්විඳිනවා ඇත. සුභාරංචිය ගැන නව ගිවිසුමේ අපෝස්තුළුවරු කීවේ මෙයමය. අභිරහස විසඳීම රහසේ යතුර දැන් ඔවුන් සතුව තිබුණි.

## ක්‍රිස්තුස්වහන්සේ නැවත පැමිණීමේ අවශ්‍යතාවය

අපෝස්තුළුවරුන්ට විසඳිය හැකි තවත් රහසක් විය. ඔබ දැනටමත් මේ ප්‍රශ්නය නගනවා විය හැක. දෙවියන්වහන්සේ මේ දෙවරක් පැමිණීම සූදානම් කළේ ඇයි? අමරණීය බලයන් සහිතව යේසුස්වහන්සේ නැවත නොනැගිට්ටේ ඇයි? එවිට ඔහුට දාවිත්ගේ සිංහාසනයේ සිට පාලනය කළ හැකිව තිබුනා නේද? වසර දෙදහසක පමණ පරතරයක් තිබුණේ ඇයි? එම ප්‍රශ්නයට පිළිතුරු ඔබටත් මටත් ඉතා වැදගත්ය. එය නවගිවිසුමේ බොහෝ තැන්වල ඇතුලත්ව ඇත.

එපිස 3 හි අපෝස්තුළු පාවුල්ගේ වචන අපි කියවමු. ඔහු මෙසේ පවසයි. "එළිදරව් කිරීම කරණකොටගෙන ඒ රහස මට ප්‍රකාශවූ බවය. ශුද්ධ ප්‍රේරිතයන්ටත් ප්‍රොපේතවරුන්ටත් ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන දැන් එළිදරව්කර තිබෙන ලෙස වෙන පරම්පරාවලදී මනුෂ්‍ය පුත්‍රයන්ට දන්වනු නොලැබුණේය. එනම් සුභාරංචිය කරණකොටගෙන ක්‍රිස්තුස්වහන්සේ තුළ අන්‍යජාතීන් හවුල් උරුමක්කාරයන් බවත්, ශරීරයේ හවුල් අවයවයන් බවත්, පොරොන්දුවට හවුල්කාරයන් බවත්ය. (3,5,6 පද)

මේවා පුදුම සහගත වචනය. අන්‍යජාතිකයා යනු යුදෙව්වෙකු නොවන කෙනෙකුය. සියවස් ගණනාවක් දෙවියන්වහන්සේගේ පොරොන්දු උන්වහන්සේගේ යුදෙව් ජනයාට අයත් විය. නමුත් දැන්, සුභාරංචිය නමැති දැල අන්‍යජාතීන්ද අයත්වන ලෙස පුළුල්ව එලා ඇත. ඒ පොරොන්දුවලදී මෙසියස්වහන්සේගේ පාලනයේදී අපට කොටස්කරුවන් විය හැක. ඔහු මෙසේ ලියයි. "පෙර කාලයේදී මාංසයෙන් අන්‍යජාතිකයන්ව සිටියාවූ නුඹලා..... ක්‍රිස්තුස්වහන්සේගෙන් වෙන්ව, ඉශ්‍රායෙල්ගේ නාගරිකත්වයට අන්‍යයන්ව සිටියාවූ නුඹලා........ පොරොන්දුවේ ගිවිසුම්වලට විදේශීන්ව, ලෝකයෙහි

බලාපොරොත්තුවක් නැතිව, දෙවියන්වහන්සේත් නැතිව සිටි බව සිහිකරපල්ලා. නමුත් වරක් දුර සිටියාවූ නුඹලා දැන්, ක්‍රිස්තුස්යේසුස්වහන්සේ තුළ උන්වහන්සේගේ ලේ කරණකොටගෙන ලංකරනු ලැබුවහුය." (එපීස 2:11-13)

අපගේ තේමාව වන ඊශ්‍රායලයේ බලාපොරොත්තුව මේ ඡේදයේ ඉතා පැහැදිළිව පෙන්වන අයුරු තේරුම් ගත්තේද? එපීසයේ විශ්වාසවන්තයෝ සිටියේ "බලාපොරොත්තු විරහිත" භාවයකිනි. මිලියන ගණනකට සහ ඔබට අද මේ මොහොතේ හැගෙන්නේද මෙයමය. අප ඉගෙන ගන්නා පොරොන්දුවේ ගිවිසුම් ඔවුන් ඉගෙන ගෙන තිබුණි. ඒ පොරොන්දුවල අන්තර්ගතයවූ බලාපොරොත්තුව ඔවුන් විසින් ග්‍රහණය කරගෙන තිබුණි. ක්‍රිස්තුස්වහන්සේගේ රුධිරය මගින්, ඔවුන් ළහට කැඳවා තිබුණි.

## රුධිරයෙන් මුද්‍රාකළ ගිවිසුමක්

දෙවියන්වහන්සේගේ පොරොන්දු ගිවිසුම් වලින් යහපත්ම දෑ තවත් අනාගතයේදී ඉටුවන්නට ඇත්තේය. ඒවා හරියටම ඉටුවන්නේ කවදාදැයි අපි නොදනිමු. දේව පොරොන්දු විශ්වාස කර බලාපොරොත්තුව සිටි බොහෝ දෙන දැනටමත් සොහොන්වලය. යේසුස්වහන්සේගේ නැවත ආගමනයට පෙර අපද මියයා හැක. මා හැඟි සත්‍යය නම් අප මිය ගියද අපටත් දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ සතුට රස විඳීමට අවස්ථාව ඇත යන්නය. අපෝස්තුළුවර පාවුල් ඔහුගේ මරණ මංචකයේ, සිරගෙදර සිට ලියූ ලෙස, අපට නැවත ජිවිතයට පැමිණිය හැක. ඔහු මෙසේ පවසයි. ස්වාමින්වහන්සේගේ ධර්මිෂ්ඨකමේ කිරුළ ඒ දිනයේදී මට දෙනු ලබන්නේය. මට පමණක් නොව, ඔහුගේ පැමිණීම බලාපොරොත්තුවන සියල්ලන්ටමය."

මෙසියස්වහන්සේ පැමිණි විට ඔහු කෙරෙහි විශ්වාසයෙන් මියගිය සියල්ලන් මරණින් නැගිටුවා, ඔවුනට උන්වහන්සේගේ මෙන්ම වඩා හොඳ අමරණීය සිරුරක් දෙනු ඇත. ආබ්‍රහම් නිසැකවම එහි සිටිනු ලබන අතර, දාවිත් සහ පාවුල් ද සිටිනු ඇත. අපටද එහි සිටීමට හැකි වනු ඇත.

අප දෙවියන්වහන්සේ සමීපයට ගෙනාවාවූ ක්‍රිස්තුස්වහන්සේගේ රුධිරයට ඒ සියල්ල කල හැකි විය. අප යුදෙව් වුවද අන්‍යජාති වුවද, අපි සියල්ලම පවුකාරයන් වෙමු. දේවනීතිය කඩකරන නිසා මරණය හැර වෙන කිසිවක් අපට හිමි නැත. යේසුස්වහන්සේගේ පාපයෙන් තොර ආත්ම පූජාව උන්වහන්සේට එක්වන සියල්ලන්ගේ සොහොනේ බලය බිඳ දැම්මේය. මෙසේ මෙම පැමිණීම් දෙකම වෙන් කල නොහැකි ලෙද එකිනෙක බැඳී පවතී. කුරුසිය කිරුළට පෙර පැමිණේ. වධ විඳින සේවකයා රජුන්ගේ රජ වේ. ආබ්‍රහම් තම කූඩාරමේ සිටි,

යේසුස්වහන්සේ දේශනාකරමින් ඇවිදගිය දේශය, ඔවුනට සහ ඔවුන්ගේ පවුල්වලට සදාකාලයටම භුක්ති විඳීමට දෙනු ඇත.

පෙන්තකෝස්ත දිනයේදී පේදුරු නැගිසිට, යෙරුසලම් නගරයෙහි ජනතාවට මේ පැමිණීම් දෙක විස්තර කරන විට, ඔහු ලඟ වැදගත් පණිවිඩයක් විය. අපි නැවත මේ වචන දෙස බලමු. "පශ්චාත්තාපව හැරියල්ලා" (ක්‍රියා 3:19) ඔහු ඔහුගේ ශ්‍රාවකයන්ට විස්තර කරමින් යේසුස්වහන්සේගේ පැමිණීමට සූදානම් වන ලෙස, ඔවුන්ගේ ජීවිත ආපසු හරවා වෙනස් මගක යාමට ඉල්ලිය. එදින සෙනඟ ඔහුගෙන් ඔවුන් කල යුතු කුමක්දැයි ඇසූ විට, ඔහු පැවසුවේ "නුඹලා සියල්ලෝම පසුතැවිලිව, පව්කමාව පිණිස යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් බව්තිස්මය ලබාපල්ලා" (2:38)

## පොරොන්දුවල උරුමක්කාරයින්

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනයේ අප ඉදිරියේ තබා ඇති බලාපොරොත්තුවේ වටිනාකම ඔබ වරක් අගය කිරීමට ආරම්භ කල විට, එය ලබා ගන්නා ක්‍රමය දැන ගැනීමට ඔබට අවශ්‍යය වනු ඇත. එඩ එඩාත් කියැවීමේදී, අනුගමන කිරීම සඳහා දෙවියන්වහන්සේ මිනිසාට ප්‍රමිතියක් දී ඇති බවත්, එයට ඔබ තවම ලඟාවී නොමැති බවත් වැටහෙනු ඇත. ඇත්තෙන්ම ඔබට දෙවියන්වහන්සේ සතුටු කිරීමට අවශ්‍යය නම්, යෙරුසලමේ වැසියන් මෙන් ඔබගේ මනස පිරිසිදු කිරීමේ අවශ්‍යතාවය හැඟෙනු ඇත. දෙවියන්වහන්සේ නිර්දේශ කරන්නේ, යේසුස්වහන්සේගේ නමට බෞතිස්ම වී, සංකේතාත්මකව අපගේ පැරණි ජීවිතය සෝදා හැර, අලුත උපන්නාක් මෙන් ආරම්භයක් කර දෙවියන්වහන්සේගේ ශුද්ධ වූ පවුලේ සාමාජිකයන් වීමටයි. නව ගිවිසුම ප්‍රකාශ කරන්නේඅපට ඒ දේවරාජ්‍යය පිළිබඳ පොරොන්දුවල උරුමක්කාරයන් විය හැකි බවයි. පාවුල් මෙසේ ලියයි. "නුඹලා සියල්ලෝම ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ ඇදහිල්ල කරනකොට ගෙන දෙවියන්වහන්සේගේ පුත්‍රයෝය" (ගලාති 3:26)

කල්පනා කරන්න ! දේව පුත්‍රයන් සහ දේව දුවරුන් යැයි කීම කෙතරම් අයිතිවාසි කමක්ද? "මක්නිසාද නුඹලාගෙන් ක්‍රිස්තුස්වහන්සේ තුළට බෞතිස්ම කරනු ලැබූ සියල්ලෝ ක්‍රිස්තුස්වහන්සේ පැළඳගත්තෝය. නුඹලා සියල්ලන් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ එක්කෙනෙක්ව සිටින නිසා, යුදෙව්වෙක් හෝ ග්‍රීකයෙක් නැත්තේය. දාසයෙක් හෝ නිර්දාසයෙක් නැත්තේය. පුරුෂයෙක් හා ස්ත්‍රියක් නැත්තාහ. ඉඳින් <u>නුඹලා ක්‍රිස්තුස්වහන්සේගේ නම්, නුඹලා ආබ්‍රහම්ගේ වංශයද පොරොන්දුව ලෙස උරුමක්කාරයෝ වන්නාහුය."</u> (ගලාති 27-29 පද)

යේසුස්වහන්සේ උරුමකර ගන්නා සියල්ල - දේශය, සිංහාසනය, ආශිර්වාද - මේ සියල්ල අපගේ වන්නේය. දෙවියන්වහන්සේ අපට දෙන දෙය සිතීම පවා මොනතරම් විශ්මයජනකද. එය මෙසේ වන්නේ, අප දැනටමත් දෙවියන් වහන්සේගේ නව ගිවිසුම උන්වහන්සේගේ සෙනඟ සමඟ කරන ගිවිසුම අපට හඳුන්වාදී තිබෙන නිසාය. දෙවියන්වහන්සේගේ නීතිය අපගේ හදවත් වල ලියා ඇත. අපගේ පාපයන් සෝදා හැර ඇත. අප මතු පැමිණෙන යුගයේ ස්ථානයකට හිමිකම් කියනු ඇත. ඒ යුගයේ යුද්ධය සහ සාගතය, පාපය සහ කනගාටුව පෘථිවිය මඟින් සදහටම තුරන්ව යනු ඇත.

රෝම 11 වැනි පරිච්ඡේදයේ පාවුල් තවත් උදාහරණයක් දෙයි. ඔහු පවසන්නේ, අන්‍යජාතිකයන් වන අප, වල් ඔලිව ගසක දලු වලට සමාන බවත්, දෙවියන්වහන්සේ වන උයන් පාලකයා එහි රැස්කරන දලු ඊශ්‍රායෙල් නම් ඔලිව්ගයේ කඳට බද්ධ කර ඇති බවයි. පිවය ගලා එන පොහොසත් සාරය අප භුක්තිවිඳින අතර අස්වැන්න නෙලන කාලය දක්වා අපි එහි සිටිමු. "මේ අභිරහස නුඹලා නොදැන සිටිනවාට නොකමැත්තෙමි"යි ඔහු පවසයි. පැමිණීම් දෙක අතර ඇති දිගු හිඩැස විස්තර කරමින්, "ඊශ්‍රායෙල්වරුන්ට තරමක් දුරට දැඩි කමක් පැමිණ තිබෙන බව" පවසයි. ඔහු අදහස් කරන්නේ, යේසුස් සහ ඔහුගේ අපොස්තුලුවරන් ගෙනා පණිවිඩය පිළිගත්තේ යුදෙව්වන්ගෙන් සුළුපිරිසක් බවය. සෙස්සන්ගේ හදවත් බොහෝ තද හෙයින් රාජ්‍යයේ බීජය රෝපණය කිරීම අපහසු විය.

නමුත් ඊශ්‍රායෙල් හදවතේ දැඩිකම සදහටම නොවේ, "අන්‍යජාතීන්ගේ සම්පූර්ණත්වය පැමිණෙන තුරු," හෙතෙම දිගටම පවසයි. "මේ ආකාරයෙන් මුලු ඊශ්‍රායල් ගලවනු ලබන්නේය." ඉන්පසු ඔහු යෙසෙයාගේ "මෙසියස්" ජේදයක් උපුටා දක්වමින් - "ගැලවුම්කරු සියොන් කෙරෙන් පැමිණ යාකොබ් තුළින් දුෂ්ඩකම තුරන් කරන්නේය." "ඔවුන් සමඟ මා කරන ගිවිසුම මේය"යි යෙරමියා 33 හි අප කියැවූ ජේදය පුනරුච්චාරණය කරමින්, "මා ඔවුන්ගේ පාප ඉවත් කළ විට" යැයි පවසයි. (රෝම 11:24-27)

කාල වකවානුව බලන්න - අන්‍යජාතීන් සම්පූර්ණත්වයට පැමිණි විට, එය තවමත් සිදුවී නොමැත. දෙවියන්වහන්සේ තවමත් අපට ඔහුගේ පවුලට එක්වීමට අඬගසයි. නමුත් දිනෙක, ඉක්මනින්, සමහරවිට ඉතා ඉක්මනින් දොර වසා දමනු ඇත. යේසුස්වහන්සේ ජාතීන් පාලනය කිරීමට බලය සහිතව වඩිනු ඇත. දේව නීතියට අවනතා කිරීම නිසා මිනිසුන් විනිශ්චය කිරීමට වඩිනු ඇත.

## දෙවියන්වහන්සේට අමතක නොවූ බවට සලකුණු

යේසුස්වහන්සේගේ පැමිණීම ඉතා ආසන්න බැව් අප දැනගන්නේ කෙසේද? ඉතා සුළු පිළිතුරක් ඇත. ඊශ්‍රායෙලය දෙස බලන්න. ! දෙවියන්වහන්සේ තම වචනයේ පිහිටනවා නම්, ලෝකය පුරා විසුරුවා හරින ලද ජාතිය සියවස් ගණනක් පුරා නොමැර සිටියහ. අපගේ පරම්පරාවේදීම ඔවුහු ආපසු ඔවුන්ගේ දේශයට යාම ආරම්භ කර ඇත. 1967 දී ඔවුහු ඔවුන්ගේ පෞරාණික අගනුවරවූ යෙරුසලම හෝ සියොන්, ආපසු ගත්හ. දැන් ඔවුන්ගේ සතුරෝ ඔවුන්ට විරුද්ධව රැස්වෙමින් සිටිති. ගැලවුම්කරු ආපසු තම සිංහාසනයට පැමිණීමේ ජවනිකාව සූදානම්ය. උන්වහන්සේගේ ශුද්ධවූ කන්දවන සියොන්හි තම රජතුමා පිහිටුවීමටය. අපගේ විශ්වාසය ශක්තිමත් කිරීමට සලකුණු සියල්ල එහි ඇත. දහස් ගණනක් පරම්පරාවල් වලට පොරොන්දු ඉටු කරන දෙවියන්වහන්සේ, උන්වහන්සේගේ හස්තය නැවත ප්‍රදර්ශනය කරමින් සිටී.

මෙතෙක් දුරට ඊශ්‍රායලයේ බලාපොරොත්තුව ගැන කල්පනා කරමින් සිටි අපි, එහි එකතුව අලංකාර ජේදයකින් අවසන් කරමු. එය අපට පහසුව දෙන, උපදෙස් දෙන, ජිවිතයේ දුක් කරදරවලට මුහුණ දීමට ධෛර්යය දෙන බව අපි කියෙමු. අපෝස්තුලුවරයා හෙබ්‍රෙව්වරුන්ට ලියන ලිපියේ සඳහන් කරන්නේ මෙසේය. "දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට පොරොන්දුව දුන් කල........... තමන්ම ගැන දිවුරමින්, නුඹට බොහෝ සෙයින් ආශිර්වාද කරන්නෙමි. බොහෝ සෙයින් නුඹ වර්ධනය කරන්නෙමි."

## නැංගුරක් මෙන් ස්ථිර

ඔහු තව දුරටත් මෙසේ සඳහන් කරයි. " ඒ නිසා දෙවියන්වහන්සේ පොරොන්දුවේ උරුමක්කායන්ට තමන්වහන්සේගේ අභිප්‍රාය වෙනස් නොවන බව බොහෝ සෙයින්ම පෙන්වන්නට කැමතිව, දිවුරුවකින් මැදිහත්වූ සේක. මෙසේ කළේ දෙවියන්වහන්සේ විසින් බොරු කියන්ට බැරි වූ වෙනස් නොවන කාරණා දෙකක් කරණකොට ගෙන, අප ඉදිරියේ තබා තිබෙන බලාපොරොත්තුව අල්ලා ගැනීමයට"ය (හෙබ්‍රෙව් 6:13-18) වෙනස් නොවන කාරණා දෙකක්: අපට දෙවියන්වහන්සේගේ වචනය තිබේ, එය පමණක් වුවද සෑහේ. ස්ථිරත්වය දෙගුණයක් කිරීමට, උන්වහන්සේ අපට දිවුරුමක් ද දී ඇත. එහි අදහස, මෙම පොරොන්දුව ගැන සැක කිරීමට අපට කොහොත්ම

බැරි බවය. ඔහු මෙසේ අවසන් කරයි. "ආත්මයේ සන්තකවූ, ස්ථිරවූ, තිරයෙන් ඇතුලට යන්නාවූ නැංගුරමක් මෙන් අපට ඇත්තේය." (19 පදය)

දෙවියන්වහන්සේගේ පොරොන්දු විශ්වාස කරන මිනිසුන් සහ ගැහැණුන්, වියරු සාගරයේ අඳුරු රාත්‍රියක ඔබ මොබ විසිකරන්නාවූ, නමුත් සියලු අනතුරින් ආරක්‍ෂා වීමට පත්ලේ පර්වත වල තදින් කා වැදුනු ශක්තිමත් නැංගුරම් හෙළූ ආරක්‍ෂිත නැවකට සමානය. ඔබ මේ බලාපොරොත්තුව ඔබගේම නොකරගන්නේද?

- ජෙරාල්ඩ් එම්. පියර්ස් -

# ප්‍රශ්න

1. දෙවියන්වහන්සේ ආබ්‍රහම් සඳහා දුන් පොරොන්දු තුනක් සඳහන් කරන්න.

2. "පොළොවේ සියළු ජාතීහු ආශිර්වාද ලබන" පැවතෙන්නෙකු (බීජයක්) ආබ්‍රහම් ලබන බැව් දෙවියන්වහන්සේ පොරොන්දු විය. (උත්පත්ති 28:18)

3. දෙවියන්වහන්සේ ඔහුට වූ පොරොන්දු ආබ්‍රහම් හට ලැබුනේද? එසේ නැතිනම්, දෙවියන්වහන්සේ පොරොන්දුවූ දේ ඔහු හට ලැබෙන්නේ කවදාද?

4. ආබ්‍රහම් සහ දාවිත් ගැන දෙවියන්වහන්සේ පාවිච්චි කරන හැඳින්වීම් මොනවාද? මේ නම් වලින් දෙවියන්වහන්යේ ඔවුන් අමතන්නේ ඇයි?

5. දෙවියන්වහන්සේ දාවිත් රජු හට වූ පොරොන්දු මොනවාද? සලමොන් රජු විසින් ඒවා ඉටු නොවුනු බැව් අප දැනගන්නේ කෙසේද? දෙවියන්වහන්සේ දාවිත් හටවූ පොරොන්දුවේ විෂයය කවුරුන්ද?

6. (අ) යෙසායා
   (ආ) යෙරමියා
   (ඇ) එසෙකියෙල්
   මගින් දෙවියන්වහනසේවූ පොරොන්දු විස්තර කරන්න.

7. දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට සහ දාවිත්ට වූ පොරොන්දු, යේසුස්වහන්සේ උපන් විට සම්පූර්ණවීමට පටන් ගත්තේ යැයි අප දැනගන්නේ කෙසේද? (ඔබගේ පිළිතුර ඔප්පු කිරීම සඳහා බයිබල් පාඨයක් දෙන්න.)

8. දෙවියන්වහන්සේ ආබ්‍රහම් සහ දාවිත් සමඟ කළ ගිවිසුම ස්ථිර සහ මුද්‍රා කළේ කෙසේද?

9. මෙම පොරොන්දුව අවසානයේදී සම්පූර්ණ වන්නේ කවදාද?

10. මෙම පොරොන්දු තුළ ඔබ කොටස්කරුවෙකු වන්නේ කෙසේද? දෙවියන්වහන්සේ කළ පොරොන්දු අනුව, අප ආබ්‍රහම්ගේ පැවතෙන්නන් සහ උරුමකාරයන් විය හැකි, දෙවියන්වහන්සේ ස්ථාපිත කළ මාර්ගය කුමක්ද?